vikalpa
විකල්ප
மாற்று வழி

පුරවැසි ජනමාධ්‍ය වැඩසටහන
මාධ්‍ය ඒකකය
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
තෙවන කලාපය
සැප්තැම්බර් 2007

# පුරවැසි  ජනමාධ්‍ය - සිදුවීම් දෙකක්

ලෝකය පුරා පුරවැසි ජනමාධ්‍ය වඩ වඩා බලපෑම් සහගත මෙහෙවරක් ඉටු කරමින් සිටී. මේ උදාහරණ, අපේ අසල්වැසි රටෙනුත්, රජය විසින් දැවැන්ත ලෙස මාධ්‍ය වාරණයට ලක් කරන චීනයෙනුත් ය.

### චීනය

චීනයේ පළාත් දෙකක  දීර්ඝ කාලයක් පුරා කුඩා දරුවන් වහල් මෙහෙයේ යොදවමින් කරගෙන යනු ලැබූ ගඩොල් කැපීමේ ව්‍යාපාරයක් පිළිබඳව මුල් වරට හෙළිදරව් වූයේ පුරවැසි ජනමාධ්‍ය වෙබ් අඩවියක් ඔස්සේයි. මේ ජාවාරම අදාළ පළාත් පාලන ආයතනවල ඉහළ නිලධාරීන් ගේද ආශිර්වාදය ඇතුව කරගෙන යන ලද්දක් බව අනාවරණය වී ඇත. මෙහි සේවයේ යොදවනු ලැබ ඇතැයි සැක කරන අතුරුදහන් වූ දරුවන්ගේ දෙමාපියන් 400 දෙනෙකු විසින් ලියූ ලියුමක් අන්තර්ජාලයේ පළ වීමත් සමගම චීනයේ ජාතික මාධ්‍ය විසින් මේ සිද්ධියට වැදගත් කමක් දෙන්නට පටන් ගත්හ. දැන් එය දරුණු මානව හිමිකම් අර්බුදයක් ලෙසට ලෝකයේ මානව හිමිකම් සංවිධානවල සහ අදාළ රාජ්‍ය නිලධාරීන්ගේ අවධානයට ලක් වී ඇත.

### ඉන්දියාව

භගල්පූර් ඉන්දියාවේ බිහාර් ප්‍රාන්තයේ කුඩා නගරයකි. මාලයක් කඩා ගත්තායැයි කියන පුද්ගලයෙකුට ඒ අවට සිටි මැරයින් සහ පොලිස් නිලධාරීන් එක්ව අමානුෂික ලෙස පහර දෙන අයුරුත්, පසුව පොලිස් නිලධාරියෙකු ඔහුව තම යතුරු පැදියට තබා බැඳගෙන බිම දිගේ ඇදගෙන යන අයුරුත් පුරවැසි වාර්තාකරුවෙකු විසින් තම ජංගම දුරකතන කැමරාවට හසු කර ගත්තේය. පසුව මෙය අන්තර්ජාලයේ වෙබ් අඩවියක පළ විය. ඒ සමගම මේ ක්‍රියාව පිළිබඳ විශාල පීඩනයක් පොදු ජනතාව වෙතින් එල්ල වන්නට වූ අතර අදාළ පොලිස් නිලධාරීන්ට විද්ධව නීතිමය පියවර ගැනීමට බිහාර් ප්‍රාන්ත රජයට සිදුවිය.

ශ්‍රී ලංකාවේ ද පුරවැසි වාර්තාකරුවන්ට පොදු ජනතාව වෙනුවෙන් ප්‍රබල මෙහෙවරක් ඉටු කිරීමේ හැකියාව ඇත. අදම ක්‍රියාත්මක වෙන්න.

## පුරවැසි ජනමාධ්‍ය දෙවන එක්දින වැඩමුළුව දෙනියායේ දී



ලංකාව තුළ පුරවැසි ජනමාධ්‍ය භාවිතය ප්‍රචලිත කිරීමේ අරමුණ ඇතිව අපගේ පුරවැසි මාධ්‍ය වැඩසහටහන යටතේ පැත්වීමට සැලසුම් කර ඇති එක්දින වැඩමුළු මාලාවේ දෙවැන්න 2007 සැප්තැම්බර් 06 වන දින දෙනියායේ දී පවත්වන ලදි. සී.දොඩාවත්ත මහතාගේ මූලිකත්වයෙන් පැවැත්වූ මෙම වැඩමුළුවට දකුණු පළාතේ නොයෙකුත් සිවිල් සහ මාධ්‍ය සංවිධානවලට අනුබද්ධිත තරුණ තරුණියෝ විසි දෙදෙනෙක් සහභාගි වූහ.

# පුරවැසි ජනමාධ්‍ය සහ ආචාරධර්ම




පුරවැසි වාර්තාකරුවන්ට ආරාධනා කරමින් CNN පුවත් සේවය පළකළ දැන්වීමකි. මූලාශ්‍රය : අන්තර්ජාලය

*වෘත්තීය මාධ්‍යවේදීන් වෙතින් අපේක්ෂා කෙරෙන ආචාරධාර්මික වගකීම් වලින් පුරවැසි වාර්තාකරුවන් නිදහස් කළ යුතුද නැද්ද යන්න පිළිබඳ උණුසුම් විවාදයක් වර්තමානයේ පවතී. ප්‍රවෘත්ති මූලාශ්‍රයක් ලෙස විශාල පාඨක පිරිසකට ඇසුරු කිරීමේ අවස්ථාව ඇති කවර හෝ මාධ්‍යයක්, නිරවද්‍යතාව, විනිවිද පෙනෙන සුළු බව, සාධාරණත්වය, සමබර බව ආදී වශයෙන් වූ මූලික ජනමාධ්‍ය ආචාරධර්මවලට අනුගත විය යුතු බවත්, එසේ නොවන විට ද්වේශ සහගත පහර ගැසීම් සඳහාත්, තමන්ට වාසිදායක මතවාදයන් ස්ථාපිත කිරීම සඳහාත්, ඕනෑම අයෙක් පුරවැසි මාධ්‍ය යොදා ගැනීමේ අවදානමක් පවතින බවත් මේ සම්බන්ධයෙන් ඉදිරිපත් වන සුලභ අදහසකි. එසේම අහස කඩා වැටෙනවෝ යි කියමින් දිවූ හාවා වැන්නන් පුරවැසි වාර්තාකරුවන් වූ කළ තත්ත්වය වඩාත් බරපතලය. මේ අනුව කිසියම් වෘත්තීයමය ප්‍රමිතියක්, පුරවැසි මාධ්‍ය වලටද අවශ්‍යය යන මතය දූන් දූන් තහවුරු වෙමින් පවතී. ලෝකයේ ඉතාම බලපෑම් සහගත පුරවැසි ජනමාධ්‍ය වෙබ් අඩවියක් වන Oh my News තම වාර්තාකරුවන් අනුගත විය යුතු ආචාරධර්ම මාලාවක් සකස් කර ඇත්තේ මේ අදහස අනුව යමිනි.*

## OhmyNews පුරවැසි වාර්තාකරුවන්ගේ ආචාරධර්ම මාලාව

1. පුරවැසි වාර්තාකරුවා "සියලුම පුරවැසියෝ වාර්තාකරුවෝය" යන හැඟීම ඇතිව කටයුතු කළ යුතු අතර කතා සහ ප්‍රවෘත්ති ආවරණය කරන විට තමන් හුදෙක් එම වාර්තාකරුවන් අතරින් එක් අයෙකු පමණක්ය යන්න සිහි තබා ගත යුත්තේය.
2. පුරවැසි වාර්තාකරුවා වැරදි තොරතුරු පතුරවන්නේ නැත. ඔහු පදනම් විරහිත උපකල්පනයන් සහ අනාවැකි මත රඳා හිඳිමින් ලිපි ලියන්නේ නැත.
3. පුරවැසි වාර්තාකරුවා යමෙකුට පුද්ගලිකව පහර වදින ආකාරයෙන් අපවාදාත්මක, අශ්ශීල, භාෂාවක් කිසිවිටකත් යොදා ගන්නේ නැත.
4. පුරවැසි වාර්තාකරුවා මිනිසුන්ගේ පෞද්ගලික රහස්‍යභාවය උල්ලංඝණය කරන ලිපි සම්පාදනය කිරීම මගින් අන්‍යයන්ගේ ගරුත්වයට හානි පමුණුවන්නේ නැත.
5. පුරවැසි වාර්තාකරුවා තොරතුරු රැස් කර ගැනීම සඳහා හැමවිටම යුක්ති සහගත ක්‍රම භාවිතා කරන අතර තමන් ලිපියක් ලියන්නට අදහස් කරන බව අදාළ තොරතුරු ලබා දෙන මූලාශ්‍ර වෙත පැහැදිලිව දන්වා සිටියි.
6. පුරවැසි වාර්තාකරුවා අයුතු ප්‍රයෝජන නොඑසේනම් පෞද්ගලික ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා තම පුරවැසි වාර්තාකරු තත්ත්වය පාවිච්චි කරන්නේ නැත.
7. පුරවැසි වාර්තාකරුවා තමන්ගේ හෝ තමන් අයත් වන සංවිධානයේ හෝ යහපත වෙනුවෙන් යැයි සිතා කරුණු විකෘති කරන්නේ හෝ අතිශයෝක්තියට නංවන්නේ හෝ නැත.
8. පුරවැසි වාර්තාකරුවා තමා විසින් පළ කළ වැරදි හෝ නුසුදුසු වාර්තාවක් වෙනුවෙන් වහාම ඉදිරිපත් වී පූර්ණ කණගාටුව පළ කරන්නේය.

# කුරුණෑගල අධ්‍යාපන කලාපයේ සිංහල භාෂා තරඟ පැවැත් වූ හැටි



වසරක් පාසා කොට්ඨාස, කලාප, පළාත් සභා සහ සමස්ත ලංකා මටට්ටමින් ඉහත සඳහන් තරඟ ශ්‍රී ලංකාවේ සෑම අධ්‍යාපන කලාපයකම පැවැත්වේ. මේ තරඟවලට සහභාගි කරන්නේ පාසැල්වල සිංහල භාෂාව පිළිබඳව ඉහළම දක්ෂතා ඇති සිසුසිසුවියන්ය. මේ දරුවන් තෝරා සූදානම් කිරීම සඳහා ගුරුවර ගුරුවරියෝ සෑහෙන වෙහෙසක් දරති.

පෙර වසරවලදී කොට්ඨාස මට්ටමින් පැවැත්වෙන තරඟ පළමු පාසැල්වාරය තුළ දීම අවසන් කරන ලදී . නමුත් මෙවර මෙම තරඟ දැනුම් දුන්නේ දෙවැනි වාරයේ අවසන් මාසය වන ජූලි මාසයේ ය. ප්‍රථමයෙන් 27වන දින පැවැත්වෙන බව දැනුම් දුන් ලිඛිත තරඟ පසුව සැප්තැම්බර් 08 දිනට කල් දමන ලදී. තරඟ පැවැත්වෙන්නේ කු/මලියදේව ආදර්ශ සහ සර් ජෝන් කොතලාවල යන විදුහල්වල යැයි දැනුම් දී තිබුණි. පසුව එම තරඟ ස්ථාන කු/සාමෝදය සහ කු/නිශ්ශංක යන විදුහල්වලට මාරු කර ඇති බව සැප්තැම්බර් 03දා දාතමින් පළාත් අධ්‍යාපන කාර්යාලය දැනුම් දුන්නේ ය.

මේ විකල්ප වෙබ් අඩවිය වෙත ලැබුණු පුරවැසි සටහනකි.

එම ලිපිය කල් වේලා ඇතිව නොලැබීමෙන් තරඟ පැවැති සැප්. 08 දා ගුරුවරු සහ මාපියෝ විශාල පිරිසක් කලින් දැනුම් දී තිබූ පාසැල්වලටම ගියහ. ඔවුන් නියමිත පාසැල් කරා පැමිණෙන විට පැය එකහමාරක් තරම් පසුවී තිබුණි. 6,7,8,9 වසර සඳහා තරඟ පැවැති නිශ්ශංක විදුහලට පමණක් ශිෂ්‍ය ශිෂ්‍යාවෝ 1000කට ආසන්න ප්‍රමාණයක් ද මාපියෝ සහ ගුරුවරු ද එවැනිම ප්‍රමාණයක් ද පැමිණ සිටියහ.

තරඟ පටන් ගැනීමට තිබුණේ පෙ.ව. 8.30 ය. ඒ වන විට තරඟ පැවැත්වීමට පැමිණ සිටියේ තරඟ බාරව සිටින මානව ශාස්ත්‍ර සහ සිංහල භාෂා අධ්‍යක්ෂවරිය සහ ගුරු උපදේශවරුන් දෙදෙනෙකු පමණි. තරඟ කාල සටහනක් හෝ මඟ පෙන්වීමක් හෝ තිබුනේම නැත. මේ නිසා ප්‍රධාන ශාලාව අසළ මහත් තදබදයක් සහ පොදි කෑමක් ඇති විය.

6,7,8,9 වසර සඳහා තරඟ හතර බැගින් තරඟ 16ක් පැවැත්වීමට නියමිත විය. උදෑසන 10.00 වන විට අවසන්ව තිබුනේ 6,7 වසර සඳහා ගද්‍ය තරඟය පමණි. දරුවන්ට සහ මාපියන්ට වාඩිවීමටවත් කිසිදු පහසු කමක් තිබුනේ නැත. මේ නිසා පාසැල් භූමිය තුළ තද බද තත්ත්වයක් පැවැතුණි. මේ අවස්ථාවේ සිය අසංවිධානාත්මක බව වසා ගැනීම පිණිස නිලධාරීන් කළේ දෙමාපියන් ගේට්ටුවෙන් එළියට දැමීමයි. නිවාඩු දිනෙක සිය දරුවන් සමඟ පැමිණි මාපියන්ට ලැබුණු සැළකිල්ල එසේ විය.

තරඟ පැවැත්වෙන ස්ථාන දක්වෙන පුවරුවක් නොතිබූ බැවින් මහල් තුනක් උඩට සහ පහළට දුවමින් තරඟ ස්ථාන සොයන්නට දරුවන්ටම සිදු වූයේ මාපියන්ද ගේට්ටුවෙන් පිටට දැමූ නිසාය. අසරණ වූ මේ දරුවන් ගුරුවරුන් වූ අප වෙත දුව විත් උපදෙස් අසා සිටියත් අප කිසිවකුවත් කිසිම සැලැස්මක් දැන සිටියේ නැත. ඇත්තම කතාව නම් දැන සිටීමට කිසිදු සැලැස්මක් නොවූ බව යි. තරඟ සඳහා නියමිත කාල සටහනක් දී තිබුණේ නම් මෙම තදබදය ලෙසියෙන් මඟ හරවා ගැනීමට ඉඩ තිබුණි. අවසානයේ දී සිසුසිසුවියන්ගේ අනන්‍යතා පත්‍ර කිසිවක් විමසා බැලුනේ ද නැත. තරඟ සඳහා නිශ්චිත කාලයක් දැනුම් දුන්නේ ද නැත. මේ තත්ත්වයට පත් වූයේ අපේ දක්ෂතම දරුවන් ය.

පාසැලෙ විදුහල්පතිතුමා කීයේ තමාට දැනුම් දී තිබුණේ නම් පංති කාමර පහසුකම් සහ ස්වෙච්ඡා ගුරු කණ්ඩායමක් යෙදවීමට ඉඩ තිබූ බවයි. නමුත් අධ්‍යෂවරිය කියා සිටියේ මේ සඳහා විශේෂ ගෙවීමක් නොකෙරන බැවින් මේ ටිකත් නොකර ගෙදර යා හැකි බවයි. තරඟවලට සහභාගි වූ දරුවන්ට තරඟ එපා වී තිබුණි.

දරුවන්ගේ දක්ෂතා ඔප මට්ටම් කිරීම සහ වඩා දිරිමත් කිරීම පිණිස පැවැත්වෙන මෙවැනි වටිනා අවස්ථා මෙලෙස ඕනෑවට එපාවට කිරීමෙන් සිදුවන්නේ අපේක්ෂිත අරමුණ සහමුලින්ම යටපත් වී යෑම බව අප අලුතෙන් කියා සිටිය යුතු නැත. මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වා ඉදිරි වසරේ තරඟ පැවැත්වීමේ පිළිවෙලක් සකස් කරන සේ ඉතා උවමනාවෙන් ඉල්ලා සිටිමු.

එදින සහභාගි වූ ගුරුවරියන් පිරිසක්

සැප්. 08

## හොඳ පුරවැසි ජනමාධ්‍ය කතාවක් නම්

- ප්‍රාදේශීයව අදාළ වන කාරණා පිළිබඳ කතා කරයි.
- දැනෙනසුළු ලෙස ප්‍රබලව ලියා ඇත.
- සුවිශේෂී යමක් පිළිබඳව කතා කරයි.
- හොඳින් කරුණු සොයා බලා නිවැරදිව ලියා ඇත.
- අදාළ මූලාශ්‍රය සමග කෙළින්ම සම්බන්ධවීමෙන් පමණක් ලබා ගත හැකි, ආකාරයේ, නොඉඳුල් උපුටා දැක්වීම් ඇතුළත් වෙයි.
- වෙනත් ප්‍රවෘත්ති මාධ්‍ය විසින් නොසලකා හැරීමට ඉඩ ඇති සිදුවීම් පිළිබඳව වාර්තා කරයි.
- කියවන්නා තුළ ජවයක් සහ උද්දීපනයක් ඇති කරයි.

## පුරවැසි ජනමාධ්‍ය වැඩමුළුවක් ගැන ඔබත් උනන්දුද?

පුරවැසි වාර්තාකරුවෙකු වෙන්න ඔබත් කැමතිද? පුරවැසි ජනමාධ්‍ය ගැන සාකච්ඡාවකට එකතුවෙන්න කැමති තවත් අය ඔබේ ආයතනයේ ඉන්නවාද? නැතිනම් ඔබේ ගමේ, ප්‍රජා වැඩවලට සම්බන්ධවෙන එවැනි පිරිසක් ඉන්නවාද?

එසේ නම් අපට පුළුවනි ඔබ වෙත ඇවිත් මේ වැඩමුළුව පවත්වන්න.

විකල්ප කණ්ඩායමට ලියන්න. නැතිනම් දුරකතනයෙන් කතා කරන්න. අපි එකතු වී අවශ්‍ය පහසුකම් ටික සළසාගෙන සාර්ථක වැඩමුළුවක් කරමු. ඔබේ ගමේ ප්‍රවෘත්ති, ගැටලු, ගැන ලියන පුරවැසි වාර්තාකරුවන් කිහිප දෙනෙකු හෝ බිහි කරමු.

**විකල්ප ඊ බුලටිනය පිළිබඳව ඔබගේ ප්‍රතිචාරය අපට ලබා දෙන්නේ නම් එය අපේ අනාගත ප්‍රකාශනවල ගුණය වැඩි දියුණු කර ගැනීමට පිටිවහලක් වනු ඇත. කරුණාකර මිනිත්තු කිහිපයක් මිඩංගු කර පහත සම්බන්ධකය හරහා ගොස් අපගේ ප්‍රශ්න කිහිපයට ඔබගේ ප්‍රතිචාරය සටහන් කරන්න.**

**http://tinyurl.com/33wtzc**

CPA
Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

පුරවැසි ජනමාධ්‍ය වැඩසටහන

මාධ්‍ය ඒකකය, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 1 සී, 28 වෙනි පටුමග, මල් පාර, කොළඹ - 07
දුරකථන අංක : 011-2375269, 011-2375012, ෆැක්ස් අංකය : 011-2375623
contributions@vikalpa.org, editor@vikalpa.org, info@vikalpa.org